29 /07/2009

# පුවත්පත් නිවේදනයයි.

## මාධ්‍ය නිවේදනය - ක්‍රිෂ්ණි ඉෆාම් පැහැර ගෙන යෑම.

2009 ජුනි 24 වනදා ජනමාධ්‍යවේදිනියක් වන ක්‍රිෂ්ණි ඉෆාම් වත්තල පිහිටි ඇයගේ නිවසෙන් සන්නද්ධ කණ්ඩායමක් විසින් පැහැරගෙන යෑමෙන් පහත අත්සන් කරන, සිවිල් සමාජ සංවිධාන හා මාධ්‍ය ආයතනවල ස්ත්‍රීන් වන අපි දැඩි සේ කම්පාවටත් කනස්සල්ලටත් පත් වූයෙමු. දිගින් දිගටම සිදු වූ අබිරහස් ලෙස පැහැරගෙන යෑමේ සම්ප්‍රදාය අනුව ඉෆාම් මහත්මිය ද ඇස් බැඳ සුදු වෑන් රථයකින් පැහැරගෙන යනු ලැබුවාය. ප්‍රශ්න කිරීම්වලට ලක් වූ ඇය මහනුවරදී අත හැර දමා ගොස් ඇත. තමන් පැහැර ගත් අය පොලිස් නිලධාරීන් ලෙස හඳුන්වා ගත් බව ඇය කියයි. පුවත්පත් නිදහස පිළිබඳව කරන වැඩ කටයුතු සම්බන්ධයෙන් තමාට 2008 අප්‍රේල් මාසයේදීත් 2009 ජුනි මාසයේදීත් නොහඳුනන පුද්ගලයන්ගේ තර්ජන එල්ල වූ බවද ඇය පවසන්නීය.

වසර 14 ක් තිස්සේ ජනමාධ්‍ය වෘත්තියේ යෙදෙන ඉෆාම් මහත්මිය අවස්ථා කීපයකදීම කර්තෘ සංසදය විසින් වසරේ හොඳම ජනමාධ්‍යවේදිනියට (දෙමළ මාධ්‍ය) පිරිනැමෙන විශිෂ්ටතා ත්‍යාගය දිනා ගෙන ඇති අතර ඇය 'වීරකේසරී' පුවත් පතේ ද සේවය කර ඇත.

ජනමාධ්‍යවේදියෙකුට හෝ ජනමාධ්‍යවේදිනියකට තම වෘත්තිය අනතුරකින් හෝ බාධාවකින් තොරව පවත්වා ගෙනයෑමට ඇති අයිතිය දරුණු ලෙස උල්ලංඝණය කිරීම නීතිය ක්‍රියාත්මක නොවීමත් නීතියේ ආධිපත්‍යය හිතුවක්කාර ලෙස නොසලකා හැරීමත් නැවත වරක් තහවුරු කිරීමකි. සුදු වෑන්වලින් පැහැරගෙන යෑමත් ජනමාධ්‍යවේදීන්ට පහරදීමත් දැන් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත.

මීට සමාන සිද්ධියක් වන්නේ මෙම වසරේ පෙබරවාරි මාසයේ දී 'සුඩර් ඔලි' පුවත් පතේ කර්තෘ එන්. විද්‍යාර්ථන් මහතා සුදු වෑන් රථයකින් පැමිණි පිරිසක් අත් අඩංගුවට ගැනීමේ නියෝගයක් නැතිවම මහ දහවල් පැහැරගෙන ගොස් ප්‍රශ්න කොට පොලීසියේ විශේෂ අංශයේ අත්අඩංගුවට පත් කිරීමයි. ජුනි මාසයේ මුලදී වෘත්තීය පුවත්පත් කලාවේදීන්ගේ සංගමයේ ලේකම් පෝද්දල ජයන්ත මහතා සුදු වෑන් රථයකින් පැහැරගෙන ගොස් කුරිරු ලෙස පහර දී අතහැර දමා ගොස් තිබිණ. ඔහුගේ තුවාල තවමත් සුව වී නැත. මෙය රජය විසින් විසම්මුතිය යටපත් කිරීම සඳහා මාධ්‍යකරුවන් කෙරේ නොකඩවාම ප්‍රචණ්ඩත්වය මුදවා හැරීමක් හා වෙනස් කොට සැලකීමක් යැයි අපි විශ්වාස කරමු.

ස්ත්‍රී ජනමාධ්‍යවේදිනියන් වැඩි වැඩියෙන් ඉලක්ක කරගැනීම ද අපගේ කනසල්ලට හේතු වන්නකි. 2006 නොවැම්බර් මාසයේදී සතිපතා පළවන සිංහල ප්‍රකාශනයක් වන මව්බිම පුවත් පතේ මාධ්‍යවේදිනියක් වන පරමේශ්වරී මෞනසාමි පැහැරගෙන ගොස් (එය අත්අඩංගුවට ගැනීමක් යැයි පසුව රජයෙන් ප්‍රකාශ කෙරිණ) නඩු විභාගයක් හෝ චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරන්නේ නැතිව මාස 12 කට ආසන්න කාලයක් රඳවා ගෙන සිටියාය. ඊ-ක්වොලිටි ප්‍රින්ටර්ස් හි අයිතිකරු ඇන්. ජෙෂිහරන් හා ඔහුගේ බිරිඳ වන වී. වලර්මති 2008 මාර්තු මාසයේ සිට ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී තිස්සනායගම් මහතා සමග රඳවා ගෙන සිටී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ චෝදනා එල්ල කොට ඇති පළමු මාධ්‍යවේදීන් වන්නේ ඔවුන්ය. එය මාධ්‍යයට හිරිහැර කිරීමේ භයානයක පූර්වාදර්ශයක් ලෙස දකිමු.

මෙය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් හෙලා දැක නිසි පියවර ගන්නා ලෙස රජයෙන් ඉල්ලා සිටියද, වරදට දඬුවම් නොලබා සිටීම, බියවැද්දීමේ වාතාවරණයක් මෙන්ම මාධ්‍ය නිදහස යටපත් කරවීමක් වන මෙම බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් වැළැක්වීම සඳහා ඵලදායී පියවරක් ගැනීමට රජය අපොහොසත්ව සිටී.

29 /07/2009

සියලුම මාධ්‍යකරුවන්ගේ අයිතීන් ආරක්ෂා වන ආකාරයට නිත්‍යානුකූලව නිසි ක්‍රියාපටිපාටියක් අනුගමනය කොට මාධ්‍යකරුවන් ආරක්ෂා කිරීමට හා මාධ්‍ය නිදහස බාධාවකින් තොරව, සුරක්ෂිතව භාවිතා කිරීමේ වාතාවරණයක් ඇති කරවන ලෙසට අපි රජයෙන් ඉල්ලා සිටිමු.

කුමුදිනී සැමුවෙල්
සේපාලි කෝට්ටෙගොඩ
සුමිකා පෙරේරා
ශානි ජයවර්ධන
වයලට් පෙරේරා
චූලනී කොඩිකාර
ෂාමිනී බොයිල්
සීතා රංජනී
ඇනීටා නේසයියා
රොසැනා ෆැලැමර් කල්දේරා
රෝහිණී වීරසිංහ
පද්මිණී චන්ද්‍රකාන්ති
සී. චන්ද්‍රා
ඒ. ශ්‍රියා
වී. ජයචිත්‍රා
වනමලී ගලප්පත්ති